**උතුරු මැද පළාත් සභාව - 2020**

------------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

උතුරු මැද පළාත් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2021 දෙසැම්බර් 20 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝබර් 27 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2 ) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයෙහි දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-----------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ උතුරු මැද පළාත් සභාවේ මූල්‍ය ප්‍රකශනවල උපලේඛන 04.2 හි පළාත් සමුපකාර අමාත්‍යාංශය විසින් 2109 දරන මූලධන වැය විෂයය යටතේ ගෙවිය යුතු වියදම් ලෙස රු.1,780,000 ක් දක්වා තිබුණි. එසේ වුවත් පළාත් සමුපකාර අමාත්‍යාංශයේ 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල එන්සීපී-පීටීජී (5) ආකෘතියේ වූ බැරකම් ප්‍රකාශයේ එම බැරකම දක්වා නොතිබුණි. ඒ අනුව නොසැසඳුණු වෙනස රු.1,780,000 ක් විය. | පිළිගනිමි. | උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් පිළියෙල කරන මූල්‍ය ප්‍රකශන සහ ඒවාට අදාළ අනෙකුත් සියලුම ලේඛනවල තොරතුරු පළාත් සභාවේ මූල්‍ය ප්‍රකශනවල තොරතුරුවලට සමාන විය යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන 06 හි යටිතල, පිරියත හා උපකරණ අපහරණය කිරීම් එකතුව රු.60,609,592 ලෙස දක්වා ඇති නමුත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල මූල්‍ය ප්‍රකාශනයන්හි ජංගම නොවන වත්කම් සංචලනය පිළිබඳ වාර්තා අනුව බැහැර කිරීම් එකතුව රු.50,283,576 ක් වීම හේතුවෙන් නොසැසඳුණු වෙනස රු.10,326,016 ක් විය. | පිළිගනිමි. | උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු විසින් පිළියෙල කරන මූල්‍ය ප්‍රකශන සමඟ සැසඳීම්කර පළාත් සභාවේ මූල්‍ය ප්‍රකශන පිළියෙළ කළයුතුය. |

| | | |
|---|---|---|
| (ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල සටහන 01 ප්‍රකාරව පළාත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු 04 කට අදාළව උතුරුමැද පළාත් භාණ්ඩාගාරයට පියවා නොතිබුණු රු.27,860,867 ක අග්‍රිම ශේෂයන් වර්ෂ 04 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණි. එම ශේෂයන්ගෙන් සියයට 95 ක් වූ වර්ෂ 10 කට අධික කාලයක සිට පැවත එන රු.26,405,861 ක ශේෂයක් ප්‍රධාන අමාත්‍යාංශය විසින් පියවිය යුතුව තිබුණි. | පිළිගනිමි. | පළාත් මූල්‍ය රීති 259.2 හා 259.3 ප්‍රකාරව දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල ඉතිරිවූ අග්‍රිම ශේෂයන් ඊළඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනයක ආපසු පියවිය යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව උතුරු මැද පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

## 1.5 මූලා‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-------------------------------------------

### 1.5.1 ශීර්ෂය 600 - උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලය

---------------------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය<br>---------------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම්<br>------------------------------- | නිර්දේශය<br>------------- |
|---|---|---|---|
| (අ) | ජනාධිපති ලේකම්ගේ රාජ්‍ය වියදම් කළමනාකරණය පිළිබඳ 2018 ඔක්තෝබර් 12 දිනැති අංක PS/CSA/11-18 දරන චක්‍රලේඛයේ 3.1 ඡේදය අනුව පළාත් ආණ්ඩුකාරවරයකු වෙත වෙන්කරනු ලබන උපරිම නිල වාහන සංඛ්‍යාව 02 ක් වන අතර, අවශ්‍ය වන්නේ නම් ආරක්ෂක කටයුතු වෙනුවෙන් එක් වාහනයක් ලබාදිය හැකි වුවත්, විගණන පරික්ෂණ දින වූ 2020 ඔක්තෝබර් 22 වන විට වාහන 05 ක් පරිහරණය කරමින් තිබුණි. | ඇමතිවරු 05 දෙනෙකුගේ කාර්යය භාරයද ආණ්ඩුකාරවරයාගේ කාර්යය භාරයද ආණ්ඩුකාරවරයාවෙත තනිවම ඉටු කිරීමට සිදුව ඇති බැවින් අමතර වාහන භාවිතා කිරීමට සිදුව ඇත. | ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛ උපදෙස් පරිදි වාහන භාවිතා කළයුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් ආණ්ඩුකාරවර ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 02 ක්, ද්විතියික මට්ටමේ එක් පුරප්පාඩුවක් සහ ප්‍රාථමික මට්ටමේ එක් පුරප්පාඩුවක් වශයෙන් පුරප්පාඩු 04 ක් පැවති නමුත් එකී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පුරප්පාඩු පිරවිය යුතුය. |

]

## 1.5.2 ශීර්ෂය 601 - උතුරු මැද පළාත් සභාව සහ පළාත් සභා ලේකම් කාර්යාලය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාව සහ පළාත් සභා ලේකම් කාර්යාලයේ ජ්‍යෝෂ්ඨ මට්ටමේ සහ ද්විතියික මට්ටමේ එක් පුරප්පාඩුවක් බැගින් පුරප්පාඩු 02 ක් පැවති අතර ප්‍රාථමික මට්ටමේ සේවකයින් 05 දෙනෙකු අතිරික්තව පැවතුණි. එසේ වුවත් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට සහ අතිරික්ත නිලධාරීන් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පුරප්පාඩු වී ඇති තනතුරුවලට බඳවා ගැනීම සහ අතිරික්ත කාර්යය මණ්ඩල ඉවත් කිරීම සිදු කළයුතුය. |

## 1.5.3 ශීර්ෂය 602 - උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ජ්‍යෝෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 02 ක් පැවති නමුත් එකී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පුරප්පාඩු පිරවිය යුතුය. |

**1.5.4 ශීර්ෂය 610 - උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය හා උතුරු මැද පළාත් නීතිය හා සාමය, මුදල් හා ක්‍රමසම්පාදන, පළාත් පාලන, ග්‍රාමීය යටිතල පහසුකම් හා විශේෂ ව්‍යාපෘති, සංචාරක අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ, ඉංජිනේරු ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| | --------------------- | ----------------------- | ------------- |
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශයට අදාළව පියවා නොතිබුණු රු.26,405,861 ක අග්‍රිම ශේෂයක් වර්ෂ 10 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණි. | පිළිගනිමි | පළාත් මූල්‍ය රීති 259.2 හා 259.3 ප්‍රකාරව දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ අග්‍රිම ශේෂයන් ආපසු පියවිය යුතුය. |
| (ආ) | උතුරු මැද පළාතේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය උදෙසා තාක්ෂණික ප්‍රමිතියෙන් යුතු වාර්තාමය වීඩියෝ වැඩ සටහනක් සකස් කිරීම, ආකර්ෂණීය පින්තූර සහිත ප්‍රමිතියෙන් යුතු පොතක් නිර්මාණය කිරීම සහ විධිමත් තොරතුරු සහිත වෙබ් අඩවියක් නිර්මාණය කිරීම වෙනුවෙන් ප්‍රධාන ලේකම් විසින් පෞද්ගලික සැපයුම්කරුවෙකු සමඟ රු.15,797,500 ක මුදලකට 2016 මාර්තු 23 දින ගිවිසුම් ගතවී තිබුණි. ගිවිසුම්ගත මුදලින් රු.12,144,500 ක් 2016 දෙසැම්බර් 26 දින වන විට ගෙවා තිබුණු නමුත් 2021 මැයි 10 දින වන විටද සැපයුම්කරු විසින් මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කර උතුරු මැද පළාතේ සංචාරක ව්‍යාපාරයේ ප්‍රවර්ධනය උදෙසා යොදා ගැනීමට හැකිවන ලෙස පළාත් සභාව වෙත භාරදී නොතිබුණි. | පිළිගනිමි. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිලි කර ඇත. | නීතිමය කටයුතු කඩිනම් කිරීම, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උල්ලංඝනය පිළිබඳව අභ්‍යන්තර පරීක්ෂණයක් පැවැත්වීම සහ මෙවැනි අඩුපාඩු නැවත ඇති නොවීමට විධිවිධාන යෙදීම කළයුතුය. |

(ඇ) අලුත්වැව කුමාර මහ විද්‍යාලයේ විදුහල්පති ළඟම පාසල හොඳම පාසල ශක්‍යතා අධ්‍යයනයකින්

| | | | |
|---|---|---|---|
| | නිල නිවාසය හා තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම සහ සුළු හා විශාල අලුත්වැඩියා කටයුතු සිදුකිරීම සඳහා රු.39,791,666 ක මුදලකට ප්‍රධාන අමාත්‍යංශ ලේකම්වරයා විසින් කොන්ත්‍රාත්කරුවකු සමහ ගිවිසුම්ගත වී තිබුණි. ශක්‍යතා අධ්‍යනයකින් තොරව ඇස්තමේන්තු සකස් කිරීම හේතුවෙන් සුළු හා විශාල අලුත්වැඩියාවන් සඳහා විචලන වැඩ යටතේ රු.3,876,335 ක මුදලක් හා ප්‍රධාන ඉදිකිරීම් සඳහා විචලන වැඩ යටතේ රු.10,926,181 ක මුදලක් ගෙවා ඇති අතර එකී මුදල් පිළිවෙලින් රු.6,521,836 ක් හා රු.33,269,830 ක් වූ මුළු ඇස්තමේන්තු වටිනාකම් වලින් පිළිවෙලින් සියයට 59 ක් හා සියයට 33 ක් විය. | ව්‍යාපෘතියට අදාළව ලබාදුන් type plan අනුව ඇස්තමේන්තු පිළියෙල කිරීම නිසා මෙම විචලතා සිදුවී ඇත. | සහ පාසලේ අවශ්‍යතාවය හඳුනාගෙන ගොඩනැගිලි සැලසුම් (plan) සකස්කර ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. මෙවැනි දුර්වලතා නැවත ඇති නොවීමට වගබලාගත යුතුය. |
| (ඇ) | පුද්ගලයින් 4000 කට වැඩි පිරිසකට ආසන සැපයිය හැකි ශ්‍රවනාගාරයක අවශ්‍යතාවයක් නොමැතිව සහ ප්‍රතිපාදන නොමැතිව ප්‍රසම්පාදන කටයුතු සිදුකර පලුගස්දමන මහා විද්‍යාලයේ ශ්‍රවණාගාරය ඉදිකිරීම සඳහා රු.542,019,300 ක මුදලකට සැලසුම් පිළියෙල කර ඉදිකිරීම (Design and Build) සඳහා ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් විසින් 2017 අප්‍රේල් 05 දින කොන්ත්‍රාත්කරුවෙකු සමහ ගිවිසුම්ගත වී තිබුණි. එසේම පළාත් මූල්‍ය රීතී 418.2 හි විධිවිධානවලින් බැහැරවීමට ලබාගත් අමාත්‍ය මණ්ඩල අනුමැතිය පදනම් කරගෙන අදියර වශයෙන් ගිවිසුම්ගත වී ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රසම්පාදන කමිටුව තීරණය කර තිබියදී සම්පූර්ණ ව්‍යාපෘතියම රු.542,019,300 ක මුදලකට ක්‍රියාත්මක කිරීමට ගිවිසුම්ගත වී තිබුණු අතර 2017 අප්‍රේල් 28 දින රු.100,000,000 ක වැඩ ආරම්භ කිරීමේ | ප.මු.රී. 46.2.2 අනුව මුළු පිරිවැය ඇස්තමේන්තුව වාර්ෂික ප්‍රතිපාදන ඉක්මවා යන විට බැරකමට බැඳීමට හැකියාව ඇත. | මෙම ව්‍යාපෘතියට අදාළව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් වාර්ෂික මුදල් ප්‍රකාශයට ඇතුළත්කර නැති නිසාත් මුදල් ප්‍රතිපාදන නොමැති නිසාත් වියදම් දැරීම සඳහා බලය දීමට කිසිදු බලධාරියෙකුට අවසරයක් නොමැති හෙයින් මේ පිළිබඳව පරීක්ෂණයක් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අත්තිකාරම්ද ගෙවා තිබුණි. එසේ වුවත් 2021 මැයි 07 දින වන විටද ඉදිකිරීම් අවසන්කර නොතිබුණි. | | |
| (ඉ) | “ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය” යටතේ නෑගම මුස්ලිම් විද්‍යාලයේ බහුකාර්යය ගොඩනැඟිල්ල ඉදිකිරීමට අදාළ බිල්පත් අනුව කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු වටිනාකම රු.7,663,843 ක් වුවත් 2017 වර්ෂයේදී රු.9,695,499 ක් ගෙවා තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරුට රු.2,031,656 ක් වැඩිපුර ගෙවා තිබුණු අතර එම වැඩිපුර ගෙවීම වෙනුවෙන් එකතු කළ අගය මත බද්ද රු.320,731 ක් ද ගෙවා තිබුණි. | එකතු කළ අගය මත බද්ද ගැලපූ විට කොන්ත්‍රාත් ආයතනයට වැඩිපුර ගෙවන ලද මුදල රු.1,410,374 කි. කොන්ත්‍රාත්කරුගෙන් මුදල් අයකර ගත් පසු විගණනයට වාර්තා කරමි. | වැඩිපුර ගෙවීම් අයකරගත යුතුය. වගකිවයුතු අයට එරෙහිව පරීක්ෂණයක් සිදුකළ යුතුය. |
| (ඊ) | “ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය” යටතේ පලුගස්දමන මහා විද්‍යාලයේ ආපනශාලාව ඉදිකිරීම සඳහා 2017 අගෝස්තු 28 දින රු.10,298,211 ක් වූ (වැට් රහිත) මුදලකට ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුම් අත්සන් කර තිබුණු අතර 2017 අගෝස්තු 31 දින ගිවිසුම්ගත වටිනාකමින් සියයට 30 ක් වූ රු.3,089,463 ක මුදලක් වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි. ගිවිසුම ප්‍රකාරව 2017 දෙසැම්බර් 28 වන දින ඉදිකිරීම් වැඩ සම්පූර්ණ කර භාරදිය යුතු වුවත් 2021මැයි10 දින වන විටද ගොඩනැඟිල්ලෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමටද කටයුතුකර නොතිබුණි. එසේ වුවත් අත්තිකාරම් බැඳුම්කරය මුදල් කරගෙන වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් මුදල අයකරගෙන නොතිබුණු අතර වර්ෂ 03 කට ආසන්න | කොන්ත්‍රාත්කරු විසින් ඉටුකර තිබුණු වෙනත් කොන්ත්‍රාත් දෙකකට අදාළ ගෙවීම්වලින් 2020 මැයි මාසයේදී මෙම අත්තිකාරම් මුදල අයකර ගන්නා ලදී. | කොන්ත්‍රාත්කරු අසාධු ලේඛනගත කර ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ වෙනත් කොන්ත්‍රාත් කරුවෙකු වෙත කොන්ත්‍රාත්තුව පිරිනැමිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාලයක් ඉකුත්වීමෙන් පසුව කොන්ත්‍රාත්කරු විසින් ඉටුකළ වෙනත් කොන්ත්‍රාත් සඳහා ගෙවීමට තිබුණු මුදල් වලින් එකී අත්තිකාරම් මුදල හිලව් කරගෙන තිබුණි. | | |
| (උ) | “ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතිය” යටතේ නල්ලච්චිය ප්‍රාථමික විදුහලෙහි ගොඩනැගිලි 04 ක් අලුත්වැඩියා කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු සමඟ රු.4,943,744 ක වටිනාකමකට 2017 වර්ෂයේදී ගිවිසුම් අත්සන් කර තිබුණු නමුත් ගුරු නිවාසයයේ හා තවත් එක් ගොඩනැගිල්ලක අලුත්වැඩියා කිරීම ආරම්භ කර අතර මඟ නවතා දමා තිබුණි. එම ගොඩනැගිලි 02 හි අලුත්වැඩියා කටයුතු 2021 මැයි 10 දින වන විටත් නැවත ආරම්භකර නොතිබුණි. එසේ වුවත් එකී කොන්ත්‍රාත්කරුට එරෙහිව ගිවිසුම් ප්‍රකාරව කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු මන්දගාමීව සිදු වූ අතර දැනට ප්‍රගතිය සියයට 75 කි. | ඉදිරිකිරීම් ප්‍රමාදය වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු කළයුතුය. |
| (ඌ) | ප්‍රධාන අමාත්‍යාංශය විසින් 2017 සහ 2018 යන වර්ෂවලදී අ/කැකිරාව තිරප්පනේ මහානාම විද්‍යාලයේ රු.11,840,935ක වියදමක් දරා ඉදිකර තිබුණු ආපන ශාලාව හා රු.8,700,703ක වියදමක් දරා ඉදිකර තිබුණු ගුරු නේවාසිකාගාරය සම්බන්ධයෙන් 2021 අප්‍රේල් 07 දින සිදුකළ ස්ථානීය පරීක්ෂාවේදී, පහත කරුණු අනාවරණය විය. | | |
| (i) | 2017 දෙසැම්බර් වන විට වැඩ නිමකර තිබුණද උක්ත කොන්ත්‍රාත්තුව විධිමත්ව භාරනොදීම හේතුවෙන් වසර 03කට වඩා | වැඩබිම භාර ඉංජිනේරුවරයාගෙන් පිළිතුරු ලබාගෙන ඉදිරිපත් කරමි. | අඩුපාඩු සම්පූර්ණ කරවාගෙන ගුරු නේවාසිකාගාරය |

| | | | |
|---|---|---|---|
| | වැඩි කාලයක් අභාවිතව පැවතුණි. එසේ පැවතීම හේතුවෙන් ගුරු නේවාසිකාගාරය තුළට ප්‍රවේශවීමට නොහැකි තරම් ඝනව කැලය වැවී තිබීම, ඇතුළත සතුන් ගැවසීම සහ ආපන ශාලාවේ සිවිලිම සඳහා යොදා තිබුණු පළල අඩි 2 හා දිග අඩි 2 ප්‍රමාණයේ සිවිලිම් තහඩු 75 ක් සහ පිටත සවිකර තිබුණු දිග අඩි 10 යි අගල් 3 හා පළල අඩි 9 ප්‍රමාණයේ විශාල වීදුරු 04 ක් (Tempered Glass) ගැලවී ගොස් තිබුණි. | | විධිමත්ව භාර ගැනීමට සහ එය භාවිතයට ගැනීමට කටයුතු කළයුතුය. |
| (ii) | ආපන ශාලාව ඉදිකිරීමට අදාළ ගිවිසුම්ගත ඇස්තමේන්තුවේ වටිනාකම රු.2,774,170 ක වැඩ අයිතම 32ක් සම්පූර්ණ නොකර ඒ වෙනුවට උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරයා අනුමත නොකළ අතිරේක වැඩ යටතේ අයිතම 13 ක් සඳහා එකතුව රු.5,538,503 ක මුදලක් ගෙවා තිබුණි. ඒ අනුව ආපන ශාලාව ඉදිකිරීම සඳහා වූ ගිවිසුම්ගත ඇස්තමේන්තුගත මුදලට වඩා එකතුව රු.2,515,767ක් වැඩිපුර ගෙවා තිබුණු අතර එය මුල් ඇස්තමේන්තුවට වඩා සියයට 27ක වැඩිවීමක් විය. | වැඩබිම භාර ඉංජිනේරුවරයාගෙන් පිළිතුරු ලබාගෙන ඉදිරිපත් කරමි. | අනුමත නොකරන ලද අතිරේඛ වැඩ ඉටුකළ සහ ඒ සඳහා ගෙවීම්කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (iii) | 2016 දෙසැම්බර් 02 දින ගුරු නේවාසිකාගාරය ඉදිකිරීමේ කාර්යය සඳහා ප්‍රධාන අමාත්‍යාංශය විසින් ගිවිසුම් ගතවී තිබුණු රු.12,180,508 ක ඇස්තමේන්තුවෙන් සියයට 32 ක්වූ එකතුව රු.3,922,999 ක වැඩ අයිතම 46 ක් අතහැර දමා ඉදිකිරීම අවසන් කර තිබුණි. | වැඩබිම භාර ඉංජිනේරුවරයාගෙන් පිළිතුරු ලබාගෙන ඉදිරිපත් කරමි. | අවශ්‍ය වැඩ කොටස් හඳුනා නොගෙන එකතුව රු.3,922,999 ක් වූ වැඩ අයිතම 46 ක් ඇස්තමේන්තුවට ඇතුළත් කිරීම සම්බන්ධයෙන් විධිමත් පරීක්ෂණයක් |

| | | | |
|---|---|---|---|
| | | | පැවැත්විය යුතුය. |
| (එ) | ප්‍රධාන අමාත්‍යාංශය විසින් රු.13,790,629 ක වියදමක් දරා ඉදිකර තිබුණු අ/කැකිරාව තිරප්පනේ මහානාම විද්‍යාලයේ ක්‍රීඩාපිටිය වටා කාණු පද්ධතිය සම්බන්ධයෙන් සිදුකළ විගණනයේ දී පහත කරුණු අනාවරණය විය. | | |
| (i) | ඇස්තමේන්තුවේ 2.1 හා 2.2 අයිතම යටතේ භාවිත කරන ලද කොන්ක්‍රීට් ප්‍රමාණය පිළිවෙළින් සියයට 92 කින් හා සියයට 30 කින් වැඩිවීම හේතුවෙන් ක්‍රීඩාපිටිය වටා කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා ගිවිසුම්ගත වූ රු.11,977,650 ක වටිනාකම සියයට 15 කින් ඉක්මවා තිබුණද අතිරේක වැඩ සඳහා උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබානොගෙන ඒ සඳහා ගෙවීම් කර තිබුණි. | වැඩබිම භාර ඉංජිනේරුවරයාගෙන් පිළිතුරු ලබාගෙන ඉදිරිපත් කරමි. | අඩුපාඩු සහිතව ඇස්තමේන්තු සකස් කළ, අනුමත නොකරන ලද අතිරේක වැඩ කරවාගත් සහ ඒ සඳහා ගෙවීම්කළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව කටයුතු කළ යුතුය. |
| (ii) | ක්‍රීඩාපිටියේ ඉහළ දකුණු පස එක් කෙළවරක ස්වාභාවිකව පිහිටි කළුගල උඩට මතුව ඉතිරිවන පරිදි කළුගලට දෙපසින් පමණක් කාණු පද්ධතිය ඉදිකර තිබුණු අතර එම නිසා ක්‍රීඩා පිටියට ඉහළින් පිහිටි පුද්ගලික ඉඩම්වලින් ගලා එන ජලය ක්‍රීඩාපිටියට එකතු වී ක්‍රීඩාපිටියේ ඇතැම් ස්ථාන මඩ වගුරක්ව පැවතුණි. | වැඩබිම භාර ඉංජිනේරුවරයාගෙන් පිළිතුරු ලබාගෙන ඉදිරිපත් කරමි. | ක්‍රීඩා පිටියට ඉහළින් පිහිටි පුද්ගලික ඉඩම්වලින් ගලා එන ජලය ක්‍රීඩාපිටියට එකතු නොවන ලෙස කාණු පද්ධතියේ අඩුපාඩු සම්පූර්ණ කළයුතුය. |
| (iii) | කාණු පද්ධතිය ඉදිකිරීමේදී Shuttering සඳහා රු.2,766,280 ක මුදලක් ගෙවා තිබුණු නමුත් කාණු පැති බැම්වල දෙපස විශාල පිපුරුම් හා පිටතට නෙරා තිබුණු කොන්ක්‍රීට් කොටස් දක්නට ලැබුණු අතර | වැඩබිම භාර ඉංජිනේරුවරයාගෙන් පිළිතුරු ලබාගෙන ඉදිරිපත් කරමි. | ගෙවීම් කිරීමට පෙර වැඩබිම් භාර ඉංජිනේරුගෙන් වාර්තාවක් ලබා ගතයුතු අතර අඩුපාඩු සම්පූර්ණ |

| | | | |
|---|---|---|---|
| | බැම්වල පතුලෙන් හා පිපුරුම් ස්ථානවලින් පිටත ජලය කාණුව තුළට කාන්දුවෙමින්ද පැවතුණි. | | කරවා ගතයුතුය. |
| (ඒ) | ලෝක බැංකු ව්‍යාපෘති ප්‍රතිපාදන යටතේ 2017 වර්ෂයේ දී රු.4,859,999 ක ගිවිසුම්ගත වටිනාකමක් මත ප්‍රධාන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කර තිබුණු අ/කැකිරාව තිරප්පනේ මහානාම විද්‍යාලයේ ක්‍රීඩාපිටිය වටා වැට හා ගේට්ටුව ඉදිකිරීම සම්බන්ධයෙන් 2021 අප්‍රේල් 07 දින සිදුකළ විගණනයේ දී පහත කරුණු අනාවරණය විය. | | |
| (i) | ලංසුකරුවන් වෙත ප්‍රධාන අමාත්‍යාංශය විසින් නිකුත්කර තිබුණු ලංසු ලියවිලි එකිනෙකට වෙනස් වැඩ විෂයයන් සඳහා සකස් කර තිබුණු අතර එකී ලියවිලිවල සඳහන් තොරතුරු විස්තරාත්මකව ඇගයීමට ලක් නොකර ලංසු ලියවිලිවල එකතු වටිනාකම් පමණක් සැලකිල්ලට ගෙන අවම මිලගණන් ඉදිරිපත් කරන ලද ලංසුකරුට කොන්ත්‍රාත්තුව පිරිනැමීමට තාක්ෂණික ඇගයීම් කමිටුව නිර්දේශ කර තිබුණි. | පිළිගනිමි. | කිසියම් පාඩුවක් සිදුවුවහොත් එය තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් වෙත පැවරිය යුතුය. |
| (ii) | දැල් වැට ඉදිකිරීමේදී 1.52 m ක උසින් වූ Gauge 10 යේ දැල් ( Chain link mesh) වර්ග මීටර් 826.2 ක් සඳහා, වර්ග මීටරයකට රු.767 බැගින් එකතුව රු.633,695ක මුදලක් ගෙවා තිබුණි. එසේ වුවත් අදාළ තාක්ෂණික නිලධාරීන් සමඟ විගණන නිලධාරීන් ලබාගත් තත්ත්ව පාලන සහතිකය අනුව ඒ සඳහා යොදා තිබුණු දැල Gauge 12 ප්‍රමාණයේ වූ බැවින් ඒ සඳහා රු.253,478 ක් වැඩිපුර ගෙවා | වැඩබිම භාර ඉංජිනේරුවරයාගෙන් පිළිතුරු ලබාගෙන ඉදිරිපත් කරමි. | නියමිත ප්‍රමිතිය සහිත දැල් යොදා නැවත දැල් වැට ඉදිකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. මෙම දැල ඇස්තමේන්තුගත ගුණත්වයෙන් යුක්ත නොවීම හේතුවෙන් බොහෝ ස්ථානයන්හි දී එය විශාල ලෙස ඉරී හානි වී තිබුණි. | | |
| (ඔ) | පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සංචාරක නිවාසය 2020 වර්ෂයේ අදියර 02 ක් යටතේ ගිවිසුම්ගත වටිනාකම රු.3,898,452 ක මුදලකට අලුත්වැඩියා කිරීමට ප්‍රජා පාදක සංවිධාන 02 ක් වෙත ලබාදී තිබු නමුත්, මු.රෙ. 20 ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොතිබුණි. 2012 ජනවාරි 05 දිනැති අංක 01/2012 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 ඡේදය ප්‍රකාරව ප්‍රජාපාදක සංවිධානවල මූල්‍යාම හැකියාව පිළිබඳ ඇගයීමක් සිදුනොකර කොන්ත්‍රාත්තුව ලබා දී තිබුණි. | පිළිගනිමි. | මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කළ යුතුවීම සහ ප්‍රජාපාදක සංවිධානවල මූල්‍යාම හැකියාව පිළිබඳ ඇගයීමක් සිදුකර කොන්ත්‍රාත්තු ලබා දිය යුතුය. |
| (ඕ) | ප්‍රධාන අමාත්‍යාංශය විසින් ඇස්තමේන්තුගතකර තිබුණු පිරිවැය රුපියල් මිලියන 32.77 ක් වූ ඉදිකිරීම් ව්‍යාපෘති 05 ක් වෙනුවෙන් 2020 දෙසැම්බර් 31 දින වන විට රුපියල් මිලියන 15.17 ක් වැය කර තිබුණු නමුත් එම ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය සියයට 35 සිට සියයට 55 දක්වා පරාසයක පැවතුණි. | පිළිගනිමි. | භෞතික ප්‍රගතිය අඩු මට්ටමක පවතින ව්‍යාපෘති හඳුනාගෙන එකී ව්‍යාපෘති කඩිනමින් නිම කිරීමට කටයුතු කළ යුතුය |
| (ක) | අ/කැකිරාව තිරප්පනේ මහානාම | | |

| | | | |
|---|---|---|---|
| | විද්‍යාලයේ තෙමහල් ගොඩනැගිල්ලක් හා ප්‍රාථමික ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා රු.41,451,987 ක වටිනාකමකට කොන්ත්‍රාත්කරුවකු සමඟ 2017 මාර්තු 13 දින ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් විසින් ගිවිසුම්ගත වී තිබුණි. ඒ සම්බන්ධයෙන් 2021 අප්‍රේල් 07 දින සිදුකළ විගණනයේ දී පහත කරුණු අනාවරණය විය. | | |
| (i) | ICTAD – SBD – 2007 දෙවන සංස්කරණයෙහි කොන්ත්‍රාත් සඳහා වන කොන්දේසි අංක 51 හි නියමයන් හා ඒ සම්බන්ධයෙන් වන නියමිත ක්‍රියාපටිපාටි අනුව වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවීම සඳහා අදාළ ව්‍යාපෘතිය අධීක්ෂණය භාර ඉංජිනේරු වෙතින් නිර්දේශ ලබා ගතයුතු වේ. එසේ වුවත් එකී නිර්දේශයක් ලබා නොගෙන කොන්ත්‍රාත්කරුට රු.14,508,196 ක (VAT සහිතව) වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා තිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් භූමියේ බෙස් වලවල් කිහිපයක් පමණක් කපා වැඩ අතහැර දමා තිබුණි. | ප්‍රධාන අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි අත්තිකාරම් ලබා දී ඇත. | අත්තිකාරම් මුදල් ගෙවූ නිලධාරීන්ට සහ ගිවිසුම් ප්‍රකාරව වැඩ නිම නොකළ කොන්ත්‍රාත්කරුට එරෙහිව නීතිමය පියවර ගත යුතුය. |
| (ii) | රු.12,435,596 ක අත්තිකාරම් ඇපකරය සහ රු.2,072,600 ක කාර්යසාධන ඇපකරය 2018 මාර්තු 31 දින දක්වා පමණක් වලංගුව පැවතුණු අතර ඒවායේ වලංගු කාලය අවසන්වීමට දින 58 කට පෙර කොන්ත්‍රාත්කරු වැඩ අතහැර දමා ඇති බව කැකිරාව ප්‍රාදේශීය ඉංජිනේරු විසින් ප්‍රධාන අමාත්‍යාංශ ලේකම් වෙත | අධික රාජකාරී ස්වාභාවයත් නුපුහුණු කාර්යය මණ්ඩලයක් සේවය කිරීම නිසාත් ඇපකර නියමිත කාලසීමාව තුළදී අලුත්කරගත නොහැකි වී ඇත. | කොන්ත්‍රාත්කරු වැඩ අතහැර දමා ඇති බව දැනගත් වහාම අත්තිකාරම් ඇපකරය සහ කාර්යසාධන ඇපකරය මුදල් කර ගැනීමට කටයුතු නොකළ නිලධාරීන්ට එරෙහිව විනයානුකූලව |

| | | | |
|---|---|---|---|
| | දන්වා තිබුණද වගකිවයුතු නිලධාරින් යථෝක්ත ඇපකරවල වලංගු කාලය අවසන්වීමට පෙර ඒවා මුදල්කර ගැනීමට කටයුතු කරනොතිබුණි. | | කටයුතු කළ යුතුය. |
| (iii) | මෙම තෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීම වෙනුවෙන් පාසලේ පැවති අඩි 80 x 20 ප්‍රමාණයේ පැරණි ගොඩනැගිල්ලක්ද කඩා ඉවත්කර තිබුණු බැවින් සිසුන්ගේ පන්ති කාමර අවශ්‍යතාවය සපුරාලීමට නොහැකි වී තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | නව ගොඩනැගිල්ල ඉතා කඩිනමින් ඉදිකර සිසුන්ගේ පන්ති කාමර අවශ්‍යතාවය සපුරාලීමට ක්‍රියා කළයුතුය. |
| (ග) | “ළහම පාසල හොඳම පාසල” වැඩසටහන යටතේ ප්‍රධාන අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කළ අ/කැකිරාව තිරප්පනේ මහානාම විද්‍යාලයේ ක්‍රීඩා ප්‍රේක්ෂකාගාරය ඉදිකිරීම සඳහා රු.4,542,277 ක මුදලක් මත ගිවිසුම්ගත වී සිටි කොන්ත්‍රාත්කරු 2017 වර්ෂයේදී එහි වැඩ ආරම්භ කර තිබුණි. එකතුව රු.1,086,085 ක වටිනාකමින් යුතු වැඩ කොටසක් පමණක් නිමකර යථෝක්ත ව්‍යාපෘතිය අතහැර දමා තිබුණු අතර ඒ සඳහා ගෙවා තිබුණු රු.1,086,085 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. එහිදී ඉටුනොකළ වැඩ සඳහාද රු.63,700 ක මුදලක් ගෙවා තිබුණි. | ක්‍රීඩා පිටිය සඳහා වෙන්කරගත් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා ප්‍රේක්ෂකාගාරයේ වැඩ නිම කිරීමට නොහැකි විය. | ව්‍යාපෘතිය අවිච්ඡේදකර වැඩ නිමකළ යුතු අතර ඉටු නොකළ වැඩ සඳහා ගෙවීම්කළ නිලධාරීන්ගෙන් එම මුදල අයකර ගත යුතුය. |
| (ඝ) | අ/කැකිරාව තිරප්පනේ මහානාම විද්‍යාලයේ ක්‍රීඩාපිටිය සහිත භූමිය වැඩිදියුණු කිරීම සඳහා රු.5,061,771 ක වටිනාකමකට 2017 මැයි 15 දින කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ප්‍රධාන අමාත්‍යාංශයේ ලේකම් විසින් ගිවිසුම්ගත වී තිබුණි. ඒ සඳහා අවස්ථා 03 කදී එකතුව රු.7,124,767 ක මුදලක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණු අතර | ව්‍යාපෘතියට වෙන්කළ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා ක්‍රීඩා පිටියේ වැඩ නිම කිරීමට නොහැකි විය. | ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති නම් පළාත් මූල්‍ය රීති 46.1 ප්‍රකාරව ගිවිසුම්ගත නොවිය යුතු හෙයින් මෙයට වගකිවයුතු නිලධාරීන්ට සහ කොන්ත්‍රාත්කරුට එරෙහිව නීතිමය පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තුකළ පස් ප්‍රමාණයට අතිරේකව පස් කියුබ් 5770 ක් සපයා තිබුණි. විගණිත දිනය වූ 2021 අප්‍රේල් 07 දින වන විටත් වැඩ නිම නොකර අත්හැර දමා තිබුණු අතර පාසලේ දරුවන්ට ක්‍රීඩාකිරීමට තිබුණු අවස්ථාවද වසර 05 කට වැඩි කාලයක් තිස්සේ අහිමි වී තිබුණි. එසේම මෙම ක්‍රීඩාපිටිය තැනීම සඳහා ගෙවා තිබුණු රු.7,124,769 ක මුදල නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | | |
| (ට) | ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘති ප්‍රතිපාදන මත සිදුකළ ඉදිකිරීම් වෙනුවෙන් මැනුම්පත්, වැඩ අවසාන වාර්තාව හා බිල්පත් ගෙවීම් සාරාංශය ඇතුළු ලියකියවිලිවල මුල් පිටපත් මත එක් අවස්ථාවකදී සහ එකී ලියකියවිලිවල ඡායා පිටපත් මත තවත් අවස්ථාවකදී වශයෙන් ද්විත්ව ගෙවීම් සිදුකර තිබුණි. විගණන නියැදි පරීක්ෂණයේදි 2020 පෙබරවාරි 26 දින වනවිට ද්විත්ව ගෙවීම් මගින් වංචනිකව ලබාගෙන තිබුණු මුදල රු.8,608,290 ක් විය.මෙම සම්පූර්ණ මුදලම අයකර ගැනීම සහ ද්විත්ව ගෙවීම් සිදුකළ නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියා මාර්ග ගැනීම අවසන්කර නොතිබුණි. | ද්විත්ව ගෙවීම් මත වැඩිපුර ගෙවා ඇති මුදල් අයකරමින් පවතින අතර අදාළ නිලධාරීන්ට එරෙහිව විනය පරීක්ෂණ ආරම්භ කර ඇත. | වංචනිකව ලබාගෙන තිබුණු රු.8,608,290 ක මුදල වහාම අයකරගත යුතු අතර වංචනික නිලධාරීන්ට එරෙහි විනය කටයුතු කඩිනම් කළයුතුය. |
| (ඩ) | ළඟම පාසල හොඳම පාසල ව්‍යාපෘතියේ ප්‍රතිපාදන යොදවා ක්‍රියාත්මකකර තිබුණු ගිවිසුම්ගත මුදල රු.21,946,785 ක් වූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 02 ක් වෙනුවෙන් රු.9,066,775 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් ගෙවා ඇති නමුත් ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කර නොතිබුණු බව | පිළිගනිමි. | ගිවිසුම් ප්‍රකාරව වැඩ අවසන් කර නොතිබුණු කොන්ත්‍රාත්වලට අදාළව ගෙවා තිබුණු අත්තිකාරම් අයකර ගැනීමට සහ ගිවිසුම් ප්‍රකාරව වැඩ |

| | | | |
|---|---|---|---|
| | නියැදි විගණනයේදී අනාවරණය විය. එසේ වුවත් එකී අත්තිකාරම් අයකර ගැනීමට සහ ගිවිසුම් ප්‍රකාරව වැඩ නිමනොකළ කොන්ත්‍රාත්කරුවන් සම්බන්ධයෙන් නීතිමය කටයුතු කිරීම සිදුකර නොතිබුණි. | | නිමනොකළ කොන්ත්‍රාත්කරුවන්ට එරෙහිව නීතිමය පියවර ගැනීමට ක්‍රියාකළ යුතුය. |
| (න) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04 ක්,ද්විතියික මට්ටමේ පුරප්පාඩු 37 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 03 ක් වශයෙන් පුරප්පාඩු 44 ක් පැවති නමුත් එකී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පුරප්පාඩු පිරවිය යුතුය. |

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (ත) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 571(2) හා (3) | 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍යාංශයට අදාළ පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.224,682,194 ක් වූ අතර වර්ෂ 02 කට අධික කාලයක් ඉක්මවා තිබුණු රු.162,554,132 ක් | පිළිගනිමි. | වර්ෂ 02 කට අධික කාලයක් ඉක්මවා තිබුණු තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව තැන්පත්කරු විමසා ආපසු ගෙවීම හෝ ආදායමට ගැනීම කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | වූ තැන්පතු මුදල් රෙගුලාසි ප්‍රකාරව ආපසු ගෙවීමට හෝ එසේ කළ නොහැකි නම් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) 2017 ජනවාරි 26 දිනැති අංක CSA/1/4 දරන ජනාධිපති ලේකම්ගේ ලිපිය 02 වන ඡේදය | විදේශගත වන කණ්ඩායමේ සංඛ්‍යාව 05 ට අඩු නම් භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගතයුතු වුවද, 2018 වර්ෂයේ ප්‍රධාන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයා ජපානයේ කළ සංචාරය සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කරන ලදී. | චක්‍රලේඛ ලිපියේ විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධව සුදුසු පියවර ගත යුතු අතර මෙවැනි උල්ලංඝනය වීම් නැවත සිදු නොවීමට විධිවිධාන යෙදිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබාගෙන නොතිබුණි. | | |
| 03 වන ඡේදය | විදේශගත වන කණ්ඩායමේ සංඛ්‍යාව 05 ට වැඩි නම් භාණ්ඩාගාරයේ අනුමැතිය, මෙන්ම ජනාධිපති කාර්යාලයේ අනුමැතියද ලබා ගතයුතු වුවද, 2017 වර්ෂයේ ප්‍රංශයේ සහ ජර්මනියේ කළ සංචාරය හා සිංගප්පුරුවේ කළ සංචාරයන් සඳහා නිලධාරීන් 06 දෙනෙකු බැගින් සහභාගි වී තිබුණු නමුත් එම සංචාර 02 සඳහා ප්‍රධාන අමාත්‍යාංශය විසින් ජනාධිපති කාර්යාලයේ අනුමැතිය ලබා ගෙන නොතිබුණි. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කරන ලදී. | චක්‍රලේඛ ලිපියේ විධිවිධාන උල්ලංඝනය කිරීම සම්බන්ධව සුදුසු පියවර ගත යුතු අතර මෙවැනි උල්ලංඝනය වීම් නැවත සිදු නොවීමට විධිවිධාන යෙදිය යුතුය. |

(ණ) **උතුරු මැද පළාත් ප්‍රධාන අමාත්‍ය අරමුදල**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
| --- | --- | --- |
| 1992 අංක 5 දරන ප්‍රධාන අමාත්‍ය අරමුදල ප්‍රඥප්තියේ 3(1) වගන්තිය මඟින් අරමුදලේ පරිපාලනය සහ කළමනාකරණය, ප්‍රධාන අමාත්‍යවරයා සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන් දෙදෙනෙකු ඇතුළු 06 දෙනෙකුගෙන් සමන්විත වූ එහි පාලක මණ්ඩලය වෙත පවරා තිබුණු අතර පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව අරමුදල, පවත්වාගෙන යා යුතු ක්‍රමවේදය ප්‍රඥප්තියේ දක්වා නොතිබුණු බැවින් පළාත් සභාව විසුරුවා හරිනලද දින සිට එය අක්‍රීයවී පැවතුණි. | පිළිගනිමි. | පළාත් සභාව විසුරුවා හැරීමෙන් පසුව අරමුදල, පවත්වාගෙන යා යුතු ක්‍රමවේදය ප්‍රඥප්තියට ඇතුළත් කළයුතුය. |

**1.5.5 ශීර්ෂය 611 - උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුව**

---

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවට අදාළව පියවා නොතිබුණු රු.80,000 ක අග්‍රිම ශේෂයක් වර්ෂ 01 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණි. | පිළිගනිමි. | පළාත් මූල්‍ය රීති 259.2 හා 259.3 ප්‍රකාරව දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ අග්‍රිම ශේෂයන් ඊළඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනයක ආපසු නොපියවීම සම්බන්ධව පරීක්ෂණයක් සිදුකර නිසි පියවර ගත යුතුය. |
| (ආ) | උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවට අයත් වාහන 03 ක් 2019 සහ 2020 වර්ෂවලදී අවස්ථා 05 කදී අනතුරුවලට ලක්වීම නිසා එකතුව රු.2,498,180 ක අලාභයක් සිදුවී ඇති බවට ප්‍රාරම්භක පරීක්ෂණ වාර්තාවන්වල සඳහන් කර තිබුණු නමුත් උතුරු මැද පළාත් මූල්‍ය රීති 54.1.6 ප්‍රකාරව එම අනතුරුවලට වගකිවයුතු පුද්ගලයන් හඳුනාගෙන අලාභයන් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | අනතුරුවලට වගකිවයුතු පුද්ගලයන් හඳුනාගෙන උතුරු මැද පළාත් මූල්‍ය රීති 54.1.6 ප්‍රකාරව අලාභයන් අයකර ගැනීමට කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ එක් පුරප්පාඩුවක්, තෘතියික මට්ටමේ පුරප්පාඩු 07 ක් සහ ද්විතියික මට්ටමේ පුරප්පාඩු 47 ක් වශයෙන් පුරප්පාඩු 55 ක් පැවති නමුත් එකී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පුරප්පාඩු පිරවිය යුතුය. |

**1.5.6 ශීර්ෂය 612 - උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

-----------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විෂයය අංක 61211 (කාර්යාල කාර්ය මණ්ඩලය) දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 46 දෙනෙකුට, අනෙකුත් පළාත් සභාවල පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 08 දෙනෙකුට, සේවය කරමින් සිට මියගොස් ඇති නිලධාරීන් 03 දෙනෙකුට, විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් 13 දෙනෙකුට, සේවය අතහැර ගිය නිලධාරියෙකුට සහ වැඩ තහනම් කළ නිලධාරියෙකුට අදාළ එකතුව රු.7,948,736 ක ණය | පිළිගනිමි. | ආයතන සංග්‍රහයේ, 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ සහ 2019 ජුනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ණය ශේෂයන් නිරවුල් කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| | ශේෂයක් මාස 03 ත් වර්ෂ 07 ත් අතර කාලයක් අයවීම හිඟහිට තිබුණි. එසේම උතුරු මැද පළාත් සභාවේ වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 08 දෙනෙකුට අදාළ රු.1,123,933 ක ණය ශේෂයක් පියවීමට කටයුතු නොකර මාස 03 ත් වර්ෂ 07 ත් අතර කාලයක් ගතවී තිබුණි. එසේ වුවත් එකී ණය ශේෂයන් ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 1:6, 1:7, 4:2:2, 4:2:4, 4:2:5, 4:5, 4:6 හා 6:3 වගන්තිවල විධිවිධාන, 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදයේ විධිවිධාන සහ 2019 ජූනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ විෂයය අංක 61201 (පාසල් කාර්ය මණ්ඩලය) දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුමේ 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සභාවේ අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 101 දෙනෙකුට, අනෙකුත් පළාත් සභාවල පළාත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 481 දෙනෙකුට, | පිළිගනිමි. | ආයතන සංග්‍රහයේ සහ 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ සහ අංක 05/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03(ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ණය ශේෂයන් නිරවුල් කළයුතුය. |

මධ්‍යම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, සංස්ථා හා මණ්ඩලවලට ස්ථාන මාරු වී ගිය නිලධාරීන් 119 දෙනෙකුට සේවය කරමින් සිට මියගොස් ඇති නිලධාරීන් 19 දෙනෙකුට, විශ්‍රාම ගොස් ඇති නිලධාරීන් 180 දෙනෙකුට, වැඩ තහනම් කළ නිලධාරීන් 19 දෙනෙකුට, සේවය අතහැර ගිය නිලධාරීන් 18 දෙනෙකුට සහ විදේශගතවී ඇති නිලධාරියෙකුට අදාළ එකතුව රු.48,637,496 ක ණය ශේෂයක් මාස 03 ත් වර්ෂ 32 ත් අතර කාලයක් අයවීම හිඟහිට තිබුණි. එසේම උතුරු මැද පළාත් සභාවේ වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 03 දෙනෙකුට සහ අනෙකුත් පළාත් සභාවල අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන් 14 දෙනෙකුට අදාළ රු.924,670 ක ණය ශේෂයක් පියවීමට කටයුතු නොකර මාස 02 ත් වර්ෂ 22 ත් අතර කාලයක් ගතවී තිබුණි. එසේ වුවත් එකී ණය ශේෂයන් ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 1:6, 1:7, 3:18, 4:2:2, 4:2:4, 4:2:5, 4:5, 4:6 හා 6:3 වගන්තිවල විධිවිධාන, 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන ජාතික අයවැය චක්‍රලේඛයේ 1.1.7 ඡේදයේ විධිවිධාන සහ 2019 ජූනි 27 දිනැති අංක 05/2019 දරන රාජ්‍ය

| | | | |
|---|---|---|---|
| | මුදල් චක්‍රලේඛයේ 03(ඉ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ඇ) | කැකිරාව, තඹුත්තේගම සහ ගලෙන්බිඳුණුවැව අධ්‍යාපන කලාපවලට අයත් පාසල්වල සිසුන්ට ශිෂ්‍යාධාර ගෙවීම සඳහා ලැබී තිබුණු එකතුව රු.603,450 ක මුදලක් ශිෂ්‍යයින් වෙත ගෙවීමට හෝ ආපසු යැවීමට කටයුතු නොකර මාස 06 සිට මාස 21 දක්වා කාලයක් පොදු තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. | සාමාන්‍ය පෙළ හා උසස් පෙළ විභාගය ආසන්නයේදී සිසුන් පාසල් නොපැමිණීම නිසා ශිෂ්‍යාධාර මුදල් ඉතිරි වී ඇත. | ලැබී ඇති ශිෂ්‍යාධාර ශිෂ්‍යයින් වෙත ගෙවීමට කටයුතු කළයුතුය. |
| (ඈ) | කැකිරාව අධ්‍යාපන කලාපයේ පළුගස්වැව, පලාගල, තිරප්පනේ කොට්ඨාශ අධ්‍යාපන කාර්යාලවලට අයත් පාසල්වල 2019 වර්ෂයේ අ.පො.ස(සා.පෙළ) ඉංග්‍රීසි විෂයය අසමත් ප්‍රතිශතය පිළිවෙලින් සියයට 56,53,49 ක්ද, ගණිතය විෂයය අසමත් ප්‍රතිශතය සියයට 41,37,35 ක් ද වැනි ඉහළ අගයක් ගෙන තිබුණි. සිසුන්ගේ අසමත් ප්‍රතිශතය අවම කිරීම සඳහා ප්‍රායෝගික වැඩපිළිවෙලක් හඳුන්වා දී නොතිබුණි. | පිළිගනිමි. | ඉංග්‍රීසි සහ ගණිතය විෂයන්ගෙන් සිසුන් අසමත් ප්‍රතිශතය අඩු කිරීම සඳහා ප්‍රායෝගික වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළයුතුය. |
| (ඉ) | වැලිකන්ද ප්‍රාදේශීය සභාව විසින් 2018 වර්ෂයේ උසස් පෙළ විභාගයෙන් වැලිකන්ද කොට්ඨාශයේ පාසල් වලින් විශ්ව විද්‍යාල සුදුසුකම් ලැබූ සිසුන් 61 දෙනෙකු සඳහා මූල්‍යාධාරයන් ලබාදීමට දිඹුලාගල කලාප අධ්‍යාපන කාර්යාලය වෙත | පිළිගනිමි. | ප්‍රාදේශීය සභාව විසින් විශ්වවිද්‍යාල සුදුසුකම් ලැබූ සිසුන්ට ලබාදීමට පිරිනමා තිබුණු මුදල අදාළ සිසුන්ට ලබා නොදීමට හේතු විමසා බලා ඉදිරි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබා දී තිබුණු රු.226,000 ක මුදලින් 2021 ජුනි 30 දින වන විට ද රු.66,000 ක මුදලක් අදාළ සිසුන්ට ලබාදීමට කටයුතු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | | |
| (ඊ) | කැකිරාව කලාප අධ්‍යාපන කාර්යාලයට, කොට්ඨාශ අධ්‍යාපන කාර්යාල 05 කට, කැකිරාව ගුරු මධ්‍යස්ථානයට සහ පාසල් 125 කට අයත් ඉඩම්වල මැනුම් කටයුතු සිදුකර උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර හිඟුරක්ගොඩ කලාප කාර්යාලයට අයත් පාසල් 78 කට අදාළ ඉඩම් සඳහා බලපත්‍ර/ඔප්පු ලබා ගෙන නොතිබුණි. | පිළිගනිමි. | සියලු පාසල් හා කාර්යාලවල ඉඩම් සඳහා බලපත්‍ර/ඔප්පු ලබාගතයුතු වේ. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලයේ අනුමත ඇතැම් තනතුරුවල පුරප්පාඩු 201 ක් සහ ඇතැම් තනතුරුවල අතිරික්ත 76 ක් පැවතුණි. | පිළිගනිමි. | පුරප්පාඩු පිරවීම සහ අතිරික්ත කාර්ය මණ්ඩල ඉවත් කිරීම සඳහා පියවර ගත යුතුය. |
| (ඌ) | තඹුත්තේගම, කැකිරාව, හිඟුරක්ගොඩ, පොලොන්නරුව හා ගලෙන්බිඳුණුවැව අධ්‍යාපන කලාපයන්හී පාසල්වල ගුරුභවතුන් 28 දෙනෙකු 1993 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කාලය තුළ රජයේ වෙනත් දෙපාර්තමේන්තු හා ආයතන වෙත මුදා හැර තිබුණි. එසේම ඔවුන්ගේ සේවය ලබාගන්නා ආයතන වෙතින් සේවයට පැමිණීමේ | පිළිගනිමි. | ගුරුභවතුන් වෙනත් කාර්යයන් සඳහා මුදා හැරීම අත්හිටුවීම, මුදාහැර ඇති ගුරුභවතුන් ආපසු ගෙන්වා ගැනීම සහ ඔවුන්ට ගෙවන ලද වැටුප් ප්‍රතිපූර්ණය කර ගැනීම සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | වාර්තා ලබා නොගෙන උතුරුමැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් එකී ගුරුභවතුන් වෙත වැටුප් ලෙස රු.51,546,748 ක මුදලක් ගෙවා තිබුණු නමුත් එම වැටුප් අදාළ ආයතන වෙතින් ප්‍රතිපූර්ණය කරගෙන ගෙන නොතිබුණි. | | |
| (එ) | තඹුත්තේගම, කැකිරාව, පොලොන්නරුව, දිඹුලාගල සහ කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපයන්හී පාසල්වල වර්ෂ 04 ක සිට වර්ෂ 31 ක් දක්වා කාලයක් සේවය කරන ගුරුවරුන් 194 කගේ පරිවාස කාලයේ විශේෂ අසනීප නිවාඩු ලබාගැනීම, ආධුනික පත්වීම් ලිපියේ නම වෙනස්වීම, පරිවාස වාර්තා ලබාදී නොතිබීම හෝ ප්‍රමාද වීම, වෛද්‍ය වාර්තාවල අඩුපාඩු පැවතීම, අ.පො.ස උසස් පෙළ, උපාධි හා ගුරු පුහුණු සහතිකවල ප්‍රතිඵල සනාථ කරගෙන නොතිබීම යනාදී හේතූන් නිසා සේවය ස්ථිර කර නොතිබුණි. | පිළිගනිමි. | පවතින අඩුපාඩු කඩිනමින් නිවැරදිකර පරිවාස කාලය අවසන් වූ වහාම සේවයේ ස්ථිර කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඒ) | තඹුත්තේගම, කැකිරාව සහ ගලෙන්බිඳුණුවැව අධ්‍යාපන කලාපයන්හි මහා විද්‍යාලවල නියෝජ්‍ය විදුහල්පතිවරුන් ලෙස සේවය කරමින් සිටින ශ්‍රේණිධාරි විදුහල්පතිවරුන් පුරප්පාඩු පවතින පාසල්වල විදුහල්පතිවරු ලෙස පත් නොකර, ගුරුවරුන් 115 දෙනෙකු වැඩ බලන විදුහල්පතිවරුන් ලෙස පත්කර තිබුණි. | පිළිගනිමි. | ශ්‍රේණිධාරි විදුහල්පතිවරුන් පුරප්පාඩු පවතින පාසල්වලට පත්කර, ගුරුවරුන් පාසල්වල ඉගැන්වීමේ කටයුතු සඳහා යොමු කළයුතුය. |
| (ඔ) | සමාලෝචිත වර්ෂය අවසානයට උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසල් කාර්ය මණ්ඩලයේ අනුමත ඇතැම් තනතුරුවල පුරප්පාඩු 2515 ක් හා අතිරික්ත 93 ක් පැවති නමුත් පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට සහ අතිරික්ත සේවකයින් ඉවත් කිරීමට කටයුතුකර නොතිබුණි. | පිළිගනිමි. | පුරප්පාඩු වී ඇති තනතුරුවලට බඳවා ගැනීම සහ අතිරික්ත සේවකයින් ඉවත් කිරීම කළයුතුය. |
| (ඕ) | කැකිරාව අධ්‍යාපන කලාපයේ පළාත් සභා පාසල්වල සේවය කරන ගුරුවරුන් 193 දෙනෙකු වසර 05 කට අධික කාලයක සිට එකම පාසලක සේවය කරන නමුත් ඔවුන් පුරප්පාඩු පවතින වෙනත් පාසල්වලට ස්ථාන මාරු කිරීමට පියවර ගෙන නොතිබුණි. | පිළිගනිමි. | ස්ථානමාරු ක්‍රමවේදය අනුව පාසල් අතර ගුරුවරුන් ස්ථාන මාරුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ක) | කැබිතිගොල්ලෑව අධ්‍යාපන කලාපයේ පාසල් සඳහා විද්‍යාගාර සහකාර,පාසල් කාර්යය සහායක හා මුරකරු අනුමත සේවක සංඛ්‍යාව 104 ක් වුවත්, එම සංඛ්‍යාව ඉක්මවා සේවකයින් 71 ක් අතිරික්තව සේවයේ යොදවා වැටුප් ගෙවා තිබුණි. | පිළිගනිමි. | අතිරික්ත සේවකයින් පුරප්පාඩු පවතින වෙනත් කළාප වෙත යොමුකළ යුතුය. |
| (ග) | ගලෙන්බිඳුණුවැව අධ්‍යාපන කලාපයේ සිංහල මාධ්‍ය හා දෙමළ මාධ්‍ය පාසල්වල විෂයයන් අනුව ගුරු පුරප්පාඩු පිළිවෙලින් 102 ක් හා 52 ක් ද, ගුරු අතිරික්තතා පිළිවෙලින් 202 ක් හා 24 ක් ද පැවති අතර අතිරික්ත ගුරුවරු පුරප්පාඩු පවතින පාසල් වෙත යොමු කර මානව සම්පත් කාර්‍යක්ෂමව කළමනාකරණය කිරීම පිළිබඳ අවධානය යොමුකර නොතිබුණි. | පිළිගනිමි. | අතිරික්ත ගුරුවරුන් පුරප්පාඩු පවතින පාසල් වෙත යොමුකළ යුතුය. |

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | -------------------- | -------------------- | ----------------- | ----------------- |
| (ජ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 571(2) හා (3) | 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව ට අදාළ පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.10,909,412 ක් | පිළිගනිමි. | වර්ෂ 02 කට අධික කාලයක් ඉක්මවා තිබුණු තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව තැන්පත්කරු විමසා ආපසු ගෙවීම හෝ ආදායමට ගැනීම කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | වූ අතර වර්ෂ 02 කට අධික කාලයක් ඉක්මවා තිබුණු රු.2,431,755 ක් වූ තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව ආපසු ගෙවීමට හෝ එසේ කළ නොහැකි නම් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ට) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II වැනි පරිච්ඡේදයේ 13.3 වගන්තිය. | නිත්‍ය පත්කිරීම් කරන තෙක් තාවකාලික ප්‍රතිකර්මයක් වශයෙන් වැඩ බැලීමේ පත්කිරීමක් කළ යුතු වුවද, දිඹුලාගල අධ්‍යාපන කලාපයේ විදුහල්පති තනතුරු සඳහා වසර 1 ½ සිට වසර 25 දක්වා කාලයක සිට ගුරුවරුන් 35 දෙනෙකු වැඩබලන | පිළිගනිමි. | නිත්‍ය තනතුරු සඳහා පූර්ණකාලීනව නිලධාරීන් පත්කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | විදුහල්පතිවරුන් ලෙස සේවයේ යොදවා තිබුණි. | | |
| (ඩ) | රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පරිපාටික රීති සංග්‍රහයේ රීති අංක 147 | නිලධාරියෙකුගේ සමස්ත සේවා කාලය තුළ තාවකාලිකව මුදාහළ හැකි උපරිම කාලපරිච්ඡේදය වසර 05 ක් වුවත් හිඟුරක්ගොඩ සහ පොළොන්නරුව අධ්‍යාපන කලාපවල ගුරුවරුන් 08 දෙනෙකු ගුරුසේවයෙන් වර්ෂ 06 ත් 16 ත් අතර කාලයක් හමුදා සේවයට හා මන්ත්‍රී පෞද්ගලික කාර්යය මණ්ඩලවලට මුදාහැර තිබුණි. | පිළිගනිමි. | මුදාහළ නිලධාරීන් ආපසු ගෙන්වා ගත යුතුය. |

**(ඩ) උතුරු මැද පළාත් අධ්‍යාපන සංවර්ධන අරමුදල**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පහත සඳහන් අධ්‍යාපන සංවර්ධන අරමුදලේ ප්‍රධාන කාර්යයන් සඳහා පාලක මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ දී කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි.<br>(i)පාසල් සිසු දරුවන්ගේ ගුණාත්මක අධ්‍යාපනය නඟාසිටුවීමේ සංවර්ධන ව්‍යාපෘති සකසා ක්‍රියාත්මක කිරීම.<br>(ii)අඩු ආදායම් ලබන මෙන්ම කුසලතා පූර්ණ දරුවන්ට ද ජාතික මට්ටමේ විභාග වලින් විශිෂ්ඨ ලෙස සමත් දක්ෂ සිසුන් සඳහා අධ්‍යාපනය අඛණ්ඩව කරගෙන යාම සඳහා ශිෂ්‍යත්ව ක්‍රමයක් ඇති කිරීම.<br>(iii)පාසල් ශිෂ්‍යයන්ගේ අධ්‍යාපන කටයුතු තවදුරටත් දිරිගැන්වීම සඳහා කටයුතු කිරීම. | අදහස් දක්වා නොතිබුණි. | අරමුදලේ ප්‍රධාන කාර්යයන් ඉටුකිරීම සඳහා පාලක මණ්ඩලය වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතුය. |

### 1.5.7 ශීර්ෂය 620 - උතුරු මැද පළාත් කෘෂිකර්ම, කෘෂි නිෂ්පාදන අලෙවි, සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය සහ ධීවර කටයුතු අමාත්‍යාංශය

---

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයට අදාළව පියවා නොතිබුණු රු.1,072,848 ක අග්‍රිම ශේෂයක් වර්ෂ 06 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණි. | පිළිගනිමි. | පළාත් මූල්‍ය රීති 259.2 හා 259.3 ප්‍රකාරව දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ අග්‍රිම ශේෂයන් ඊළඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනයක ආපසු ආපසු නොපියවීම සම්බන්ධව පරීක්ෂණයක් සිදුකර නිසි පියවර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශයේ, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 30 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 02 ක් වශයෙන් පුරප්පාඩු 32 ක් පැවති නමුත් එකී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පුරප්පාඩු පිරවිය යුතුය. |

**1.5.8 ශීර්ෂය 622 – උතුරු මැද පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 17ක්, තෘතියික මට්ටමේ පුරප්පාඩු 04 ක් ද්වීතියික මට්ටමේ පුරප්පාඩු 48 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 29 ක් වශයෙන් පුරප්පාඩු 98 ක් පැවති නමුත් පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පුරප්පාඩු පිරවිය යුතුය. |

**1.5.9 ශීර්ෂය 630 - උතුරු මැද පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, පරිසර සහ පළාත් සභා කටයුතු අමාත්‍යාංශය**

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04 ක්, ද්වීතියික මට්ටමේ පුරප්පාඩු 11 ක් සහ ප්‍රාථමික මට්ටමේ එක් පුරප්පාඩුවක් වශයෙන් පුරප්පාඩු 16 ක් පැවති නමුත් එකී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පුරප්පාඩු පිරවිය යුතුය. |

## 1.5.10 ශීර්ෂය 631 - උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව

-----------------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | තඹුත්තේගම සහ කැබිතිගොල්ලෑව යන රෝහල් දෙකෙහි රුධිර කාන්දුකරණ ඒකක ජනතා අයිතියට පවරා තිබුණු නමුත්, 2020 දෙසැම්බර් 31 දින වනතුරුත් කළමනාකරණයේ දුර්වලතාවයන් මත ආරම්භ කිරීමට අසමත්වී තිබුණි. ඒ අනුව මෙම රෝහල් 02 ක සඳහා ලබාදී තිබුණු රුධිර කාන්දුකරණ යන්ත්‍ර 08 ද ඇතුළුව වියදම් කර තිබුණු රු.මි. 90.8 ක මුදලින් වකුගඩු රෝගීන් වෙත විගණිත දින වනතුරුත් කිසිදු ප්‍රතිකාරයක් ලැබී නොතිබුණු අතර, එකී ගොඩනැගිලි සහ උපකරණ අභාවිතව පැවතුණි. | පිළිගනිමි. | රුධිර කාන්දුකරණ ඒකක ආරම්භ නොකිරීමට බලපෑ කළමනාකරණ දුර්වලතාවයන් මඟහරවා ගෙන එකී ඒකකවලින් වකුගඩු රෝගීන් වෙත ප්‍රතිකාර ලබාදීම කඩිනමින් කළ යුතුය. |
| (ආ) | 2009 මාර්තු 27 දිනැති අංක 02/19/2009 දරන සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 04 (xiv) ඡේදය ප්‍රකාරව එක් එක් නිලධාරියාගේ අමතර සේවා දීමනාව නිලධාරියාගේ මාසික වැටුප් සීමාව ඉක්මවන්නේ නම් ඒ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, 2009 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දක්වා උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව විසින් එකී විධිවිධානවලට අනුකූලව ක්‍රියාකර නොතිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී ක්‍රියාත්මක කරමි. | එක් එක් නිලධාරියාගේ අමතර සේවා දීමනාව නිලධාරියාගේ මාසික වැටුප් සීමාව ඉක්මවන්නේ නම් ඒ සඳහා 2009 මාර්තු 27 දිනැති අංක 02/19/2009 දරන සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛය ප්‍රකාරව සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අනුරාධපුර ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් අවස්ථා 11 කදී අමතර කොටස් අලුතින් යොදා වාහන අලුත්වැඩියා කිරීම වෙනුවෙන් රු.1,469,042 ක් ගෙවා තිබුණු නමුත්, එම අලුත්වැඩියාවන්වල දී ඉවත් කළ එන්ජින් හෙඩ්, රේඩියේටර් කූලර්, එයාර් කන්ඩිෂන් කූලර් වැනි අමතර කොටස් ගබඩා භාර නිලධාරි වෙත භාර දී නොතිබුණි. | පිළිගනිමි. | අලුත්වැඩියාවන්ගෙන් පසු ඉවත් කළ වාහන කොටස් ගබඩාවට ලබා ගත යුතුය. |
| (ඈ) | විශේෂඥ වෛද්‍ය නිලධාරීන් 24 ක් සහ අනිකුත් වෛද්‍ය නිලධාරීන් 124 ක් ඇතුළු රෝහල් කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු 1032 ක් ද උතුරු මැද පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තු කාර්යාල කාර්ය මණ්ඩලයේ පැවති පුරප්පාඩු 64 ක් ද පිරවීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පුරප්පාඩු පිරවිය යුතුය. |

**1.5.11 ශීර්ෂය 632 - උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව**

---

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------ | ----------------------- | ------------ |
| (අ) | ඖෂධ වගා කිරීම තුළින් ඖෂධ හිඟය මඟහරවා ප්‍රමිතියෙන් යුත් ගුණාත්මක ඖෂධ රෝගීන් වෙත ලබාදීම, පළාත තුළ ඔසු උයන් 10 ක් ඇති කිරීම, ඖෂධීය ශාක වගාව සහ ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සංවර්ධනය උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ අරමුණු වුවත් එකී අරමුණු ඉටුවී නොමැති බව 2019 හා 2020 වර්ෂවල වියළි ඖෂධ මිලදී ගැනීම | පිළිගනිමි ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ඖෂධ වගා කිරීම තුළින් ප්‍රමිතියෙන් යුතු ගුණාත්මක ඖෂධ නිෂ්පාදනය කර ඖෂධ මිලදී ගැනීම සඳහා වැයවන වියදම අඩුකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සඳහා පිළිවෙලින් රුපියල් මිලියන 46 ක් හා රුපියල් මිලියන 34 ක් බාහිර සැපයුම්කරුවන් වෙත ගෙවා තිබීමෙන් අනාවරණය විය. | | |
| (ආ) | පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය සහ පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීමේදී සහ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කරගැනීමට සහ එකී ඉලක්ක ඉටුවන අයුරින් ප්‍රතිපාදන වෙන්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | තිරසර සංවර්ධන ඉලක්ක ළඟා කරගැනීමට කටයුතු කිරීම සහ එකී ඉලක්ක ඉටුවන අයුරින් ප්‍රතිපාදන වෙන්කර ගැනීම කළයුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ ජ්‍යොෂ්ය මට්ටමේ පුරප්පාඩු 21 ක්, තෘතියික මට්ටමේ එක් පුරප්පාඩුවක්, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 109 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 47 ක් වශයෙන් පුරප්පාඩු 178 ක් පැවති නමුත් එකී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පුරප්පාඩු පිරවිය යුතුය. |

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | ----------------------- | ----------------------- | ----------------- | ----------------- |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 571(2) හා (3) | 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවට අදාළ පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.8,097,102 ක් වූ අතර වර්ෂ 02 කට | පිළිගනිමි. | වර්ෂ 02 කට අධික කාලයක් ඉක්මවා තිබුණු තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව තැන්පත්කරුවන් විමසා ආපසු ගෙවීම හෝ ආදායමට ගැනීම කළ යුතුය. |

| | | |
|---|---|---|
| | | අධික කාලයක් ඉක්මවා තිබුණු රු.20,826 ක් වූ තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව ආපසු ගෙවීමට හෝ එසේ කළ නොහැකි නම් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**1.5.12 ශීර්ෂය 633 - උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ තෘතියික මට්ටමේ එක් පුරප්පාඩුවක්, ද්වීතියික මට්ටමේ පුරප්පාඩු 39 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 34 ක් වශයෙන් පුරප්පාඩු 74 ක් පැවති නමුත් එකී පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පුරප්පාඩු පිරවිය යුතුය. |

**1.5.13 ශීර්ෂය 634 - උතුරු මැද පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුව**

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවට අයත් සාලියපුර | පිළිගනිමි. | පුරප්පාඩු පිරවිය යුතුය. |

ශාන්ති වැඩිහිටි නිවාසයේ සමාජ සේවා නිලධාරී, කළමනාකරණ සහකාර, සාත්තු සේවිකා, උපස්ථායක, අරක්කැමි, සනීපාරක්ෂක කම්කරු ඇතුළු තනතුරු 09 ක පවතින පුරප්පාඩු 28 ක් සම්පූර්ණ කර නොතිබීම ගුණාත්මක සේවාවක් සැපයීමට බාධාවක් වී පැවතුණි

**1.5.14 ශීර්ෂය 640 - උතුරු මැද පළාත් සමුපකාර, වෙළඳ හා ආහාර, ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු සහ කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය**

-----------------------------------------------------------------------------------------------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|
| උතුරු මැද පළාත් සමුපකාර අමාත්‍යාංශ ලේකම්වරයා ආදායම් ගණන්දීමේ නිලධාරී වශයෙන් කටයුතු කරන ආදායම් සංකේත 03 ට අදාළව ඇස්තමේන්තු කර තිබුණු ආදායම රු.783,256,000 ක් වුවත් තථ්‍ය ආදායම රු.695,820,078 ක් වී තිබුණි. ඒ අනුව අධි ඇස්තමේන්තු වටිනාකම රු.87,435,922 ක් වූ අතර එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 11 ක් විය. | පිළිගනිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළයුතු අතර තථ්‍ය ආදායම හා ඇස්තමේන්තු ආදායම අතර විචලතාවයක් ඇති වෙතැයි පෙනී යන්නේ නම් ආදායම් ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කළ යුතුය. |

**1.5.15 ශීර්ෂය 641 - උතුරු මැද පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව**

---

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2011 අංක 01 දරන උතුරු මැද පළාත් සමුපකාර ප්‍රඥප්තිය ප්‍රකාරව පළාතේ පිහිටි සමුපකාර සමිතිවල මූල්‍ය ප්‍රකාශන, ගිණුම් වර්ෂය අවසන් වී මාස 03 ක් ඇතුළත ලබාගෙන ඒවා විගණනය කර වාර්තා නිකුත් කිරීම උතුරු මැද පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් වුවත් උතුරු මැද පළාතේ පිහිටි සමුපකාර සමිති 682 ක් විසින් ඉදිරිපත්කර තිබුණු මූල්‍ය ප්‍රකාශන 2152 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටද විගණනය කර නොතිබුණි. | පිළිගනිමි. | 2011 අංක 01 දරන උතුරු මැද පළාත් සමුපකාර ප්‍රඥප්තිය ප්‍රකාරව උතුරු මැද පළාතේ පිහිටි සමුපකාර සමිති විගණනය කර වාර්තා කඩිනමින් නිකුත් කළයුතුය. මෙම රාජකාරි ප්‍රමාදය ගැන පරීක්ෂණයක් සිදු කළ යුතුය. |
| (ආ) | උතුරු මැද පළාතේ ලියාපදිංචි සමුපකාර සමිති 682 කින් සමිති 497 ක් වසර 10 ක් තිස්සේ අක්‍රියව පැවැති නමුත් උතුරු මැද පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ඒවා ප්‍රතිසංවිධානය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිගනිමි. | අක්‍රියව පවතින සමුපකාර සමිති ප්‍රතිසංවිධානය කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04 ක්, තෘතියික මට්ටමේ පුරප්පාඩු 02 ක් ද්වීතියික මට්ටමේ පුරප්පාඩු 62 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 04 ක් වශයෙන් පුරප්පාඩු 72 ක් පැවති නමුත් එකී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පුරප්පාඩු පිරවිය යුතුය. |

**1.5.16 ශීර්ෂය 642 - පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව**

---------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන වඩු පාසල් වාණිජ අත්තිකාරම් ගිණුම මෙහෙයුම් අලාභයක් ඇතිවන ආකාරයට මෙහෙයවා තිබුණු අතර සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂ 02 ක මෙහෙයුම් අලාභයන් පිළිවෙලින් රු.6,786,822 ක්, රු.481,564 ක් සහ රු.1,510,357 ක් විය. | නිෂ්පාදනය වැඩි වුවත් විකුණුම් අඩු වී ඇත. අවසාන නිමි තොගය ඉහළ යාම හේතුවෙන් අලාභය වැඩිවී ඇත. | අත්තිකාරම් ගිණුම ලාභ ලැබීමේ තත්ත්වයට පත්කිරීම සඳහා පියවර ගත යුතුය. |
| (ආ) | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ විස්කම් පියස ගොඩනැගිල්ලෙහි පවත්වාගෙන යන ප්‍රදර්ශනාගාර කඩ කාමර 22 කින් 2016 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදයට අදාළව අයවිය යුතු රු.1,111,105 ක් වූ කුලිය හිඟව පැවතුණු අතර එම කඩ කුලී අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | පිළිගනිමි. | කඩ කුලී අයකර ගැනීමට නීතිමය ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ එක් පුරප්පාඩුවක්, ද්වීතියික මට්ටමේ පුරප්පාඩු 27 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 17 ක් වශයෙන් පුරප්පාඩු 45 ක් පැවති නමුත් එකී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි | පුරප්පාඩු පිරවිය යුතුය. |

**1.5.17 ශීර්ෂය 643 - උතුරු මැද පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | උතුරු මැද පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුව විසින් 2018 හා 2019 වර්ෂවල මිලදී ගත් වටිනාකම රු.661,344 ක් වූ ක්‍රීඩක ගමන් මලු හා සපත්තු තොගයක්ද 2019 වර්ෂයේ මිලදී ගත් රු.266,785 ක් වටිනා ක්‍රීඩා ඇඳුම් තොගයක්ද 2018 හා 2019 වර්ෂවල ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබා දී තිබුණු ටී ෂර්ට් 68 ක්ද වටිනාකම හඳුනා ගැනීමට නොහැකි වූ 2018 වර්ෂයේ දී මිලට ගත් ක්‍රීඩා ඇඳුම් තොගයක් හා 2015 වර්ෂයේදී මිලට ගත් ගමන් මලු 14 ක්ද ප්‍රයෝජනයට නොගෙන 2021මැයි 10 දින වන විටද ගබඩාවේ ගොඩ ගසා තිබුණි. | පිළිගනිමි | විධිමත් ක්‍රමවේදයකට අනුව අවශ්‍යතාවන් පවතින ක්‍රීඩා සමාජ හෝ පාසල් වෙත නියමිත වාර්තා පවත්වා ගනිමින් මෙම භාණ්ඩ ලබාදීම කළයුතුය. |
| (ආ) | පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ තනතුර සහ සහකාර ක්‍රීඩා අධ්‍යක්ෂ (තාක්ෂණික) තනතුර 2018 වර්ෂයේ සිට පුරප්පාඩු වී තිබුණු නමුත් එකී තනතුරු සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වනවිටද බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පුරප්පාඩු පිරවිය යුතුය . |
| (ඇ) | අනුමත ක්‍රීඩා පුහුණුකරු තනතුරු 20 න් 05 ක් එනම් සියයට 25 ක් සමාලෝචිත වර්ෂයේ දී පුරප්පාඩුව පැවතුණි. | පිළිගනිමි. | පුරප්පාඩු පිරවිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් ක්‍රීඩා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 02 ක්, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 05 ක් සහ ප්‍රාථමික මට්ටමේ මට්ටමේ පුරප්පාඩු 10 ක් වශයෙන් පුරප්පාඩු 17 ක් පැවති නමුත් එකී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | පුරප්පාඩු පිරවිය යුතුය. |

## 1.5.18 ශීර්ෂය 650 – උතුරු මැද පළාත් ඉඩම්, වාරිමාර්ග, මහාමාර්ග, නිවාස, ග්‍රාම සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශය

-----------------------------------------------------------------------------------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම් | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් වාරිමාර්ග අමාත්‍යාංශයට අදාළව පියවා නොතිබුණු රු.302,158 ක අග්‍රිම ශේෂයක් වර්ෂ 08 කට අධික කාලයක සිට පැවත එමින් තිබුණි. | පිළිගනිමි | පළාත් මූල්‍ය රීති 259.2 හා 259.3 ප්‍රකාරව දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ අග්‍රිම ශේෂයන් ඊළඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය විසින් නියම කරනු ලබන දිනයක ආපසු ආපසු නොපියවීම සම්බන්ධව පරීක්ෂණයක් සිදුකර නිසි පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් ඉඩම්, වාරිමාර්ග, මහාමාර්ග, නිවාස, ග්‍රාම සංවර්ධන සහ කාන්තා කටයුතු අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 02 ක් සහ ද්විතියික මට්ටමේ පුරප්පාඩු 32 ක් වශයෙන් පුරප්පාඩු 34 ක් පැවති නමුත් එකී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි | පුරප්පාඩු පිරවිය යුතුය. |

**1.5.19 ශීර්ෂය 652 – පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව**

---

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | ----------------------- | --------------------- |
| (අ) | ඉඩම් හා අනෙකුත් බලපත්‍ර ගාස්තු ආදායම උතුරු මැද පළාත් ඉඩම් කොමසාරිස්වරයා විසින් රු.112,000,000 කට ඇස්තමේන්තු කර තිබුණු නමුත් තථ්‍ය ආදායම රු.169,768,129 ක් වී තිබුණි. ඒ අනුව ඌන ඇස්තමේන්තු වටිනාකම රු.57,768,129 ක් වූ අතර එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 52 ක් වී තිබුණි. | පිළිගනිමි | මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළයුතු අතර තථ්‍ය ආදායම හා ඇස්තමේන්තු ආදායම අතර විචලතාවයක් ඇති වෙතැයි පෙනී යන්නේ නම් ආදායම් ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | නැගෙනහිර නුවරගම් පළාත හා කැකිරාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සිදු කරන ලද නියැදි විගණන පරීක්ෂණයන්ට අනුව පළාත් ඉඩම් කොමසාරිස් විසින් දීර්ඝකාලීන බදු පදනම මත රැස් කළයුතු ඉඩම් බදු, පිළිවෙලින් රු.285,138,949 ක් සහ රු.11,529,373 ක් 2020 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති අතර රජයේ ඉඩම් පිළිබඳ කාර්ය සංග්‍රහයේ 10 වැනි කාණ්ඩයේ 89 වගන්තිය සහ 11 කාණ්ඩයේ 104 සිට 125 වගන්ති ප්‍රකාරව ඉඩම් බදු ගෙවීම් ප්‍රමාද කරන්නන් හෝ ගෙවීම් පැහැර හරින්නන් සම්බන්ධයෙන් ඉඩමෙන් නෙරපීම, නඩු පැවරීම වැනි ක්‍රියාමාර්ග ගෙන නොතිබීම මෙම බදු අයවීම දුර්වල මට්ටමක පැවතීමට හේතු වී ඇත. | පිළිගනිමි | රජයේ ඉඩම් පිළිබඳ කාර්ය සංග්‍රහයේ විධි විධාන ප්‍රකාරව ඉඩම් බදු ගෙවීම් ප්‍රමාද කරන්නන් හෝ ගෙවීම් පැහැර හරින්නන් සම්බන්ධයෙන් ඉඩමෙන් නෙරපීම, නඩු පැවරීම වැනි ක්‍රියාමාර්ග ගතයුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03 ක්, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 14 ක් සහ ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 04 ක් වශයෙන් පුරප්පාඩු 21 ක් පැවති නමුත් එකී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි | පුරප්පාඩු පිරවිය යුතුය. |

**1.5.20 ශීර්ෂය 660 – උතුරු මැද ප්‍රධාන ලේකම් කාර්යාලය**

---------------------------------------------------

| විගණන නිරීක්ෂණය | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආදායම් සංකේත 05 කට අදාළව උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්වරයා විසින් ඇස්තමේන්තු කර තිබුණු ආදායම රු.378,000,000 ක් වුවත් තථ්‍ය ආදායම රු.521,076,034 ක් විය. ඒ අනුව එකී ආදායම් සංකේත 05 ට අදාළව පිළියෙලකර තිබුණු ඌන ඇස්තමේන්තු වටිනාකම රු.143,076,034 ක් වූ අතර එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 38 ක් විය. | පිළිගනිමි | මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළයුතු අතර තථ්‍ය ආදායම හා ඇස්තමේන්තු ආදායම අතර විචලතාවයක් ඇති වෙතැයි පෙනී යන්නේ නම් ආදායම් ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කළයුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ආදායම් සංකේත 2006.02.00 යටතේ වූ ප්‍රයෝජනයට ගත නොහැකි ප්‍රාග්ධන භාණ්ඩ විකුණුම් ආදායම උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්වරයා විසින් රු.21,000,000 කට ඇස්තමේන්තු කර තිබුණු අතර එය ඉකුත් වර්ෂයේ තථ්‍ය ආදායම රු.18,129,939 කින් ඉක්මවා තිබුණි. සමාලෝචිත වර්ෂයේ තථ්‍ය ආදායම රු.2,997,078 ක් වූ අතර ඒ අනුව අධි ඇස්තමේන්තු වටිනාකම රු.18,002,922 ක් විය. එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 86 ක් විය. | පිළිගනිමි | මුදල් රෙගුලාසි ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළයුතු අතර ඉකුත් වර්ෂයේ තථ්‍ය ආදායම හා ඇස්තමේන්තු ආදායම පිළිබඳව සලකා බලා සමාලෝචිත වර්ෂයේ ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පළාත් සමාජ සේවා දෙපාර්තමේන්තුවේ පරිපාලන නිලධාරි ලෙස සේවය කළ නිලධාරිනියක් රජයේ නිවාසයක වර්ෂ 20 කට වැඩි කාලයක සිට පදිංචිව සිටින අතර එකී නිලධාරිනිය 2017 මාර්තු මාසයේදී විශ්‍රාම ගොස් ඇත. එසේ වුවත් 2021 මැයි 10 දින වන විටත් ඉන් ඉවත්ව ගොස් නොතිබුණි. | පිළිගනිමි | 1971 අංක 03 හා 1974 අංක 40 දරන පනත්වලින් සංශෝධිත 1969 අංක 07 දරන රජයේ නිවාස (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත අනුව ක්‍රියා කර එම නිවාසයෙන් ඉවත් කිරීම සහ වර්ෂ 05 ක බදු කාලය ඉක්මවා එකී නිවාසයේ පදිංචිව සිටි කාලච්ඡේදය වෙනුවෙන් සාමාන්‍ය නිවාස කුලියට අමතරව දණ්ඩන කුලී අයකරගත යුතුය. |
| (ඈ) | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 6.1 වැනි ඡේදය ප්‍රකාරව රජයේ නිවාසයක වර්ෂ 05 ක බදු කාලය ඉක්මවා වර්ෂ 02 යි මාස 08 ක කාලයක් පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ සංවර්ධන නිලධාරිනියක් පදිංචිව සිටී. එසේම උප ලේඛනගත නිවාසයක් නොවන මෙම රජයේ නිවාසයේ බදු කාලය වර්ෂ 05 ඉක්මවා ගොස් තිබියදී ආයතන සංග්‍රහයේ XIX වැනි පරිච්ඡේදයේ 7.2 වැනි ඡේදය ප්‍රකාරව බදු කාලය ඉක්මවා එකී නිවාසයේ පදිංචිව සිටි කාලච්ඡේදය වෙනුවෙන් සාමාන්‍ය නිවාස කුලියට අමතරව දණ්ඩන කුලී අයකරගෙන නොතිබුණි. | පිළිගනිමි | මෙම නිලධාරිනිය නිල නිවාසයෙන් ඉවතකළ යුතු අතර වර්ෂ 05 ක බදු කාලය ඉක්මවා පදිංචිව සිටි කාලච්ඡේදය වෙනුවෙන් ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව සාමාන්‍ය නිවාස කුලියට අමතරව දණ්ඩන කුලී අයකළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ එක් පුරප්පාඩුවක්, තෘතියික මට්ටමේ පුරප්පාඩු 05 ක් සහ ද්වීතියික මට්ටමේ පුරප්පාඩු 16 ක් වශයෙන් පුරප්පාඩු 22 ක් පැවති අතර ප්‍රාථමික මට්ටමේ සේවකයින් 04 දෙනෙකු | පිළිගනිමි | පුරප්පාඩු පිරවීම හා අතිරික්ත සේවකයින් ඉවත් කිරීම සිදුකළ යුතුය. |

අතිරික්තව පැවතුණි. එසේ වුවත් එකී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට සහ අතිරික්ත නිලධාරීන් සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | --------------------- | --------------------- | ----------------- | ----------------- |
| (ඊ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 571(2) හා (3) | 2020 දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම් කාර්යාලයට අදාළ පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු.17,526,084 ක් වූ අතර වර්ෂ 02 කට අධික කාලයක් ඉක්මවා තිබුණු රු.119,000 ක් වූ තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව ආපසු ගෙවීමට හෝ එසේ කළ නොහැකි නම් ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි | වර්ෂ 02 කට අධික කාලයක් ඉක්මවා තිබුණු තැන්පතු සම්බන්ධව මුදල් රෙගුලාසි ප්‍රකාරව තැන්පත්කරුවන් විමසා ආපසු ගෙවීම හෝ ආදායමට ගැනීම කළයුතු වේ. |

**1.5.21 ශීර්ෂය 662 – උතුරු මැද පළාත් සැලසුම් හා මෙහෙයුම් දෙපාර්තමේන්තුව**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| වර්ෂ 03 ට අධික කාලයක සිට පළාත් සැළසුම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 02 ක්, ද්විතියික මට්ටමේ පුරප්පාඩු 14 ක් සහ ප්‍රාථමික මට්ටමේ එක් පුරප්පාඩුවක් ඇතුළුව පුරප්පාඩු 17 ක් පැවති නමුත් සමාලෝචිත වර්ෂයේදීද එකී පුරප්පාඩු සඳහා නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි | පුරප්පාඩු පිරවිය යුතුය. |

**1.5.22 ශීර්ෂය 665 – උතුරු මැද පළාත් ආදායම් දෙපාර්තමේන්තුව**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | ආදායම් සංකේත 03 කට අදාළව උතුරු මැද පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් ඇස්තමේන්තුකර තිබුණු ආදායම රු.249,000,000 ක් වුවත් තථ්‍ය ආදායම රු.210,413,156 ක් විය. ඒ අනුව අධි ඇස්තමේන්තු වටිනාකම රු.38,586,844 ක් වූ අතර එය ඇස්තමේන්තුගත ආදායමින් සියයට 16 ක් වී තිබුණි. | පිළිගනිමි | මුදල් රීති ප්‍රකාරව ආදායම් ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කළයුතු අතර තථ්‍ය ආදායම හා ඇස්තමේන්තු ආදායම අතර විචලතාවයක් ඇති වෙතැයි පෙනී යන්නේ නම් ආදායම් ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ආදායම් සංකේත 2003.03.01 යටතේ වූ උසාවි දඩ ආදායම උතුරු මැද පළාත් ආදායම් කොමසාරිස්වරයා විසින් රු.240,000,000 කට ඇස්තමේන්තු කර තිබුණු අතර එය තථ්‍ය ආදායමට වඩා රු.156,128,772 ක ඌන ඇස්තමේන්තුවක් විය. එකී ඌන ඇස්තමේන්තුව ඇස්තමේන්තුගත ආදායමින් සියයට 65 ක් විය. | පිළිගනිමි | මුදල් රීති ප්‍රකාරව ඉකුත් වර්ෂයේ ඇස්තමේන්තු ආදායම හා තථ්‍ය ආදායම සලකා බලා නිවැරදිව ආදායම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 11 ක්, තෘතියික මට්ටමේ පුරප්පාඩු 02 ක්, ද්විතියික මට්ටමේ එක් පුරප්පාඩුවක් සහ ප්‍රාථමික මට්ටමේ එක් පුරප්පාඩුවක් වශයෙන් පුරප්පාඩු 15 ක් පැවති නමුත් එකී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි | පුරප්පාඩු පිරවිය යුතුය. |

## 1.5.23 උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.49,661,220 ක් වූ ගොඩනැගිලිවල අයිතිය තහවුරු කර ගැනීම සඳහා එකී ගොඩනැගිලි පිහිටි ඉඩම්වල ඔප්පු හෝ පැවරුම් සහතික පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය සතුව නොතිබුණි. | පිළිගනිමි. | අයිතිය තහවුරු කර ගැනීම සඳහා ඉඩම්වල ඔප්පු හෝ පැවරුම් සහතික ලබාගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ එකතු කළ අගය මත බදු ගොනුව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් 2015 සැප්තැම්බර් මාසයේ සිට අක්‍රීය තත්ත්වයට පත්කර තිබියදී එකතු කළ අගය මත බදු පනතේ විධිවිධානයන්ට පටහැනිව 2019 දෙසැම්බර් 31 දින දක්වා ගනුදෙනුකරුවන්ගෙන් රු.7,361,498 ක එකතු කළ අගය මත බද්දක් අය කරගෙන තිබුණු අතර එකී මුදල් සමාලෝචිත වර්ෂයේ දී ආදායමට ගෙන තිබුණි. | පිළිගනිමි. | විධිමත් බලයක් නොමැතිව එකතු කළ අගය මත බදු ආපසු ගෙවිය යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරු මැද පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 04 ක්, තෘතියික මට්ටමේ පුරප්පාඩු 05 ක් සහ ද්විතියික මට්ටමේ පුරප්පාඩු 03ක් වශයෙන් පුරප්පාඩු 12 ක් පැවති නමුත් එකී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි | පුරප්පාඩු පිරවිය යුතුය. |

## 1.5.24 උතුරු මැද පළාත් මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරියේ සේවකයින්ගේ පැමිණීම හා පිටවීම සටහන් කිරීම සඳහා සවිකර ඇති ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | පිළිගනිමි. | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය ප්‍රකාරව සේවකයින්ගේ පැමිණීම හා පිටවීම සලකුණු කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර යොදාගත යුතු වේ. |
| (ආ) | 2018 වර්ෂයේ රු.42,612,200 ක් වූ ඌනතාවය 2019 වර්ෂයේදී රු.56,426,500 ක ඌනතාවයක් දක්වා වර්ධනය වී තිබීම නිසා 2015 දෙසැම්බර් 09 දිනැති අංක 02/2015 දරන මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව ප්‍රසාද දීමනා ලෙස ගෙවිය හැක්කේ රු.2,000 බැගින් වුවත් අධිකාරිය විසින් එම චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සේවකයින් 120 දෙනෙකු වෙත රු.5,000 බැගින් රු.600,000 ක මුදලක් ප්‍රසාද දීමනා වශයෙන් ගෙවා තිබුණි. | පිළිගනිමි. | මුදල් අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛයේ 01 ඡේදය ප්‍රකාරව ප්‍රසාද දීමනා ලෙස රු.2,000 බැගින් ගෙවියයුතු අතර වැඩිපුර ගෙවීම් අයකර ගතයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 1994 අංක 08 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය පිහිටුවීමේ ප්‍රඥප්තියේ II කොටසේ 6.1 (ආ) ඡේදය අනුව මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියට පළාත ඇතුළත මගී ප්‍රවාහනය සඳහා බස්රථ පාවිච්චි කිරීමට අවසරපත් නිකුත් කිරීම සහ එම අවසරපත් අලුත් කිරීම සඳහා පමණක් බලය දී ඇත. එසේ වුවත් ඊට පටහැනිව 2000 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලච්ඡේදයේ දී වර්තමාන වටිනාකම රු.16,700,000 ක් වූ අන්තර් පළාත් මාර්ග බලපත්‍ර 167 ක් නිකුත් කර තිබුණු අතර ඉන් බලපත්‍ර 72 ක වලංගු කාලයද දීර්ඝ කර පවත්වාගෙන යමින් පැවතුණි. | පිළිගනිමි. | 1994 අංක 08 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය පිහිටුවීමේ ප්‍රඥප්තියේ II කොටසේ 6.1 (ආ) ඡේදය අනුව මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරියට පළාත ඇතුළත මගී ප්‍රවාහනය සඳහා බස්රථ පාවිච්චි කිරීමට අවසරපත් නිකුත් කිරීම සහ එම අවසරපත් අලුත් කිරීම සඳහා පමණක් බලය දී ඇති නිසා ඊට අනුකූල නොවී කටයුතු කළ අය සම්බන්ධයෙන් විනය පියවර ගතයුතුය. |
| (ඇ) | 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලය තුළ අන්තර් පළාත් මාර්ග සහ පළාත් මාර්ග බලපත්‍ර හිමි බස්රථ වෙනුවෙන් නිකුත් කරන ලද දඩ පත්‍රිකා 62 ක් වෙනුවෙන් අයවිය යුතු රු.5,370,300 ක දඩ මුදල් සහ ප්‍රමාද ගාස්තු අයකර ගැනීමට මාර්ගස්ථ ප්‍රවාහන සේවා අධිකාරිය විසින් කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. | 1994 අංක 08 දරන මාර්ගස්ථ මගී ප්‍රවාහන සේවා අධිකාරිය පිහිටුවීමේ ප්‍රඥප්තියේ විධිවිධාන අනුව අන්තර් පළාත් මාර්ග සහ පළාත් මාර්ග බලපත්‍ර හිමි බස්රථ වෙනුවෙන් නිකුත් කරන ලද දඩ පත්‍රිකා වෙනුවෙන් දඩ මුදල් සහ ප්‍රමාද ගාස්තු අය කළයුතු වේ. |

## 1.5.25 උතුරුමැද පළාත් පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරිය

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි 71 ප්‍රකාරව අධිකාරිය සඳහා ගණකාධිකාරි තනතුරක් අනුමතකර නොගෙන වැඩබලන ගණකාධිකාරිවරයෙකු පත්කර සමාලෝචිත වර්ෂයේ දී රු.144,000 ක වැඩ බැලීමේ දීමනා ගෙවා තිබුණි. | පිළිගනිමි | විධිමත් පරිදි තනතුර අනුමත කරගත යුතු අතර වැඩ බැලීමේ දීමනා ආපසු අයකර ගතයුතුය. |
| (ආ) | වසර 03 ක සිට මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කරමින් පැවති අළෙවි නියෝජිතයින් 17 දෙනෙකුගෙන් අයවිය යුතු රු.571,830 ක ප්‍රගති වාර්තා අලෙවි ආදායම සමාලෝචිත වර්ෂයේ දී ද අයකර ගෙන නොතිබුණි. | පිළිගනිමි | වසර 03 ක සිට අය නොවී පවතින අළෙවි ආදායම් අයකරගත යුතුය. |
| (ඇ) | වසර 04 ක සිට නිරවුල්කර නොමැති රු.3,000,000 ක් වූ ගුරු දීමනා සමාලෝචිත වර්ෂයේදී ද නිරවුල් කිරීමට කටයුතුකර නොතිබුණි. | පිළිගනිමි | වසර 04 ක සිට ගුරු දීමනා නිරවුල් නොකිරීමට හේතු පරීක්ෂාකර අවශ්‍ය කටයුතු සිදුකළ යුතුවේ. |
| (ඈ) | 2020 දෙසැම්බර් 31 දිනට අළෙවි නියෝජිතයින් 28 දෙනෙකුගෙන් ලැබිය යුතු රු.5,942,292 ක පුවත්පත් ආදායමින් | පිළිගනිමි | පුවත්පත් ආදායම් අයනොවීමට හේතු පරීක්ෂාකර ලැබිය යුතු ආදායම් අයකර ගැනීමට |

| | | | |
|---|---|---|---|
| | රු.5,391,779 ක ආදායම් වසරකට වැඩි කාලයක සිට අය නොවී පැවතුණි. | | කටයුතු කළයුතුවේ. |
| (ඉ) | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට නියමිත කාලයේදී දායක මුදල් නොගෙවීම හේතුවෙන් රු.437,852 ක අධිභාර නිවේදනයක් පනවා තිබුණු අතර එය මූලා ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට හෝ ගෙවීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි | සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නියමිත කාලයේ දී ගෙවීමට කටයුතු නොකළ නිලධාරීන්ගෙන් අදාළ අධිභාර අයකර ගතයුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උතුරුමැද පළාත් පූර්ව ළමාවිය අධ්‍යාපන සංවර්ධන අධිකාරියේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 02 ක්, තෘතියික මට්ටමේ එක් පුරප්පාඩුවක් සහ ද්වීතියික මට්ටමේ පුරප්පාඩු 11 ක් වශයෙන් පුරප්පාඩු 14 ක් පැවති නමුත් එකී පුරප්පාඩු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි | පුරප්පාඩු පිරවිය යුතුය. |

**1.5.26 උතුරුමැද පළාත් සංවර්ධන නිර්මාණ හා යන්ත්‍රෝපකරණ ඒජන්සිය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසර 12 කට අධික කාලයක සිට ගෙවිය යුතුව පවතින | පිළිගනිමි | දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට |

| | | | |
|---|---|---|---|
| | එකතුව රු.16,011,120 ක එකතු කළ අගය මත බදු සහ රු.8,966,846 ක භාණ්ඩ හා සේවා මත බදු මුදල් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | | ගෙවිය යුතු එකතු කළ අගය මත බදු (VAT)සහ භාණ්ඩ හා සේවා මත බදු (GST) ප්‍රේෂණය කිරීමට කටයුතු කළයුතු වේ. |
| (ආ) | අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගෙන තිබුණු සේවකයින් වෙත සමාලෝචිත වර්ෂයේ දී රු.8,029,065 ක මුදලක් වැටුප් හා දීමනා ලෙස ඒජන්සිය විසින් ගෙවා තිබුණි. | පිළිගනිමි | අතිරික්ත කාර්යය මණ්ඩලය ඉවත්කළ යුතුය. |
| (ඇ) | 2015 වර්ෂයේ සිට 2020 දෙසැම්බර් 31 දින දක්වා කාල පරිච්ඡේදයට අදාළව රජයේ ආයතනවලින් අයවිය යුතුව තිබුණු යන්ත්‍ර කුලී ආදායම්, මුද්‍රණාල ආදායම් සහ වාහන අලුත්වැඩියා අංශයේ ආදායම් පිළිවෙළින් රු.2,795,558 ක්, රු.31,294,850 ක් සහ රු.2,556,908 ක් අය නොවී පැවතුණි. ඉන් පිළිවෙළින් සියයට 47 ක් වූ රු.1,304,135 ක්, සියයට 23 ක් වූ රු.7,261,712 ක් සහ සියයට 60 ක් වූ රු.1,542,131 ක් අය නොවී පැවතුණු කාලය වසර 01 සිට වසර 04 දක්වා පරාසයක විය. | පිළිගනිමි | අය නොවීමට හේතු සොයා බැලීම සඳහා පරීක්ෂණයක් සිදුකළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඉදිකිරීම් ව්‍යාපෘතිවලින් ලැබිය යුතු අත රැඳවුම් මුදල් සහ නළ ලිං ව්‍යාපෘතියක් වෙනුවෙන් ලැබිය යුතු මුදල් පිළිවෙළින් රු.8,527,044 ක් සහ රු.3,159,160 ක් වූ අතර එකී ආදායම් වසර 06 සිට වසර 17 දක්වා කාලයක සිට අය නොවී පැවතුණි. | පිළිගනිමි. | හිඟ හිටීමට හේතු සොයා බැලීම සඳහා පරීක්ෂණයක් සිදුකළ යුතුය. |
| (ඉ) | ඉකුත් වර්ෂ ගණනාවක සිට මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කරමින් පවතින එකතුව රු.18,977,029 ක් වූ ගෙවිය යුතු අත රැඳවුම් මුදල්, ගෙවිය යුතු යන්ත්‍ර කුළී සහ ගෙවිය යුතු අමතර කොටස් හා අලුත්වැඩියා වියදම් 2020 දෙසැම්බර් 31 දින වන විටද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි | සියලුම බැරකම් නිරවුල් කිරීමට හෝ සත්‍ය වශයෙන් බැරකම් නොපවතින්නේ නම් ආදායමට ගැනීමට ක්‍රියා කළ යුතුය. |